# ජාතිද්‍රෝහි රාජද්‍රෝහී සරත්

යමකු පොලිසිය විසින් හෝ හමුදා පොලීසිය විසින් හෝ අත් අඩංගුවට ගනු ලැබීම යුක්ති යුක්ත කෙරෙන ලිපියක් සාමාන්‍යයෙන් ලිවීම අපහසු කාර්යයකි. එහෙත් සරත් ෆොන්සේකා හමුදා පොලීසිය විසින් අත් අඩංගුවට ගනු ලැබීම යුක්තියුක්ත කිරීම සඳහා එක් ලිපියක් නොව ලිපි දහසක් ලිවීමට මට නම් ඉතාමත් පහසු කාර්යයකි. නීතියෙන් ඉඩක් ඇත්නම් ඔහු යුද්ධාධිකරණයක් ඉදිරියට ගෙන ආයුතු යැයි අප කියා සිටියේ පසුගිය දෙසැම්බර් 27 වැනි දා ඉරිදා දිවයින සංග්‍රහයෙනි. එයට අමතර ව අයිලන්ඩ් පුවත්පතින් ද, ජනාධිපතිවරණ ව්‍යාපාරයේ දී පවත්වන ලද කතාවලින් ද ඒ අදහස තවත් තහවුරු කෙළෙමු. අප ඒ නිගමනයට පැමිණියේ ෆොන්සේකා විසින් කරන ලද කතා කිහිපයකට සවන් දීමෙන් හා ඔහුගේ දේශපාලනය අධ්‍යයනය කිරීමෙන් පසුව ය. හමුදා පොලීසිය සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගත යුතුව තිබුණේ මාස කිහිපයකට පෙර ය. එනම් මේ සරත් ඒ සරත් (දෙසැම්බර් 06 දිවයින ඉරිදා සංග්‍රහය) බවට පත් වූ අවධියෙහි ය. ආණ්ඩුවට ඒ සඳහා අවශ්‍ය සාක්ෂි ඒ වන විට නොතිබුණා විය හැකි ය. එමෙන් ම  පසුව සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයට ඉදිරිපත්වීම නිසා ඒ වන විට අවශ්‍ය සාක්ෂි තිබුණ ද ජනාධිපති අපේක්ෂකයකු අත් අඩංගුවට ගැනීමට නුසුදුසු යැයි ආණ්ඩුව හා හමුදාව තීරණය කළා විය හැකි ය. ඒ කෙසේ වෙතත් පාඨකයාට ඉහත සඳහන් ලිපි දෙක නැවත මතක් කරගැනීම සඳහා ඉන් ඡේද දෙකක් මෙම ලිපියෙහි උපුටා දක්වමි.

“ඒ සමත් සරත් ය. මේ අසමත් සරත් ය. ඒ වෘත්තීය සෙබළ සරත් ය. මේ අපරිණත දේශපාලනඥ සරත් ය. ඒ අතිශූර සෙන්පති සරත් ය. මේ වැඩබැරි දේශපාලනඥ සරත් ය. ඒ නොනැමුණු කොන්දක් ඇති සරත් ය. මේ එජාපට දණ නැමූ සරත් ය. ඒ තම හෘදය සාක්ෂියට එකඟ ව ක්‍රියාකළ සරත් ය. මේ හෘදය සාක්ෂියක් නැති සරත් ය. ඒ රට වෙනුවෙන් අණ දුන් සරත් ය. මේ රනිල්ගේ අණට කඩේ යන සරත් ය. ඒ ඉතිහාසයේ නමක් තැබූ සරත් ය. මේ ඉතිහාසයේ කුණු කූඩයට යන සරත් ය. ඒ දෙමළ ත්‍රස්තවාදයට හා ජාතිවාදයට අභියෝග කළ සරත් ය. මේ දෙමළ ජාතිවාදයට යට වූ සරත් ය. ඒ මහින්ද රාජපක්ෂ මහතා යටතේ කොටි පරාජය කිරීමට සටන් මෙහෙය වූ සරත් ය. මේ රනිල් වික්‍රමසිංහ යටතේ දෙමළ ජාතිවාදයට රට විකිණීමට යන සරත් ය. ඒ දේශප්‍රේමී සරත් ය. මේ දේශද්‍රෝහී නඩයකට එකතු වූ සරත් ය.” (2009 දෙසැම්බර් 06) ඒ සරත් මේ සරත් බවට පත්වූයේ කෙසේ ද? ඔහු හමුදා මාණ්ඩලික ප්‍රධාන නිලධාරී බවට පත්වීමෙන් පසුව හෝ එයට ටික කලකට පෙර එහෙත් බොහෝවිට නන්දිකඩාල් ජයග්‍රහණයෙන් පසුව, එනම් පසුගිය මැයි 18 වැනි දාට පසුව, මේ රූපාන්තරණය සිදු වී යැයි සිතමි. ඔහු හමුදාපති කමින් ඉවත් වී ඇත්තේ ජුනි 15 වැනි දා ය. ඉන්පසු ඔහු හමුදා නිලධාරියකු ලෙස හමුදා මාණ්ඩලික නිලධාරියා ලෙස (ත්‍රිවිධ) හමුදාවෙහි ම නව තනතුරකට පත් කෙරිණි. ඒ සරත් මේ සරත් වීම මැයි 18 වැනි දා හා ජුනි 15 වැනි දා අතර සිදු වී යැයි විශ්වාස කළ හැකි ය. සරත් ෆොන්සේකා නන්දිකඩාල් දිනවල චීනයේ සංචාරයක යෙදී සිටි බව ද ඔහු ලංකාවට පැමිණ ඇත්තේ මැයි 17 වැනි දා බව ද පිළිගත හැකි ය. සියල්ල සිදුවන්නට පටන්ගත්තේ මැයි 18 වැනි දා ප්‍රභාකරන් මෙන් ම වාමදේවන් ම නඩේසන් හා රමේශ් මරාදැමීමෙන් පසුව ය.

එයට පෙර සරත් ෆොන්සේකාට හා ගෝඨාභය රාජපක්ෂ මහතාට විරුද්ධව පිටු 540කට අධික චෝදනා පත්‍රයක් කැලිෆෝනියාවේ උසාවියක ගොනුකර තිබිණි. ඒ ඊනියා යුද්ධාපරාධ සම්බන්ධයෙනි. මෙරට දෙමළ ජාතිවාදය ඇතිකර ඒ පෝෂණය කළ ලන්දේසීන් හා බ්‍රිතානීන් ද බටහිර යටත්විජිතවාදයට අද නායකත්වය දෙන ඇමරිකාව ද කොටි සංවිධානය පරාජය කිරීම සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ මහතාටවත් ගෝඨාභය රාජපක්ෂ මහතාටවත් කිසි දිනෙක සමාව නො දෙනු ඇත. කොටි පැරදවූයේ සරත් ෆොන්සේකා යැයි නිතර කෑමොර ගසමින් කියන එ ජා ප හා ජ වි පෙ පාක්ෂිකයන් හා හිතවතුන් අමතක කරන කරුණ නම් කලින් සිටි ජනාධිපතිවරුන් හා ජනාධිපතිනිය මෙන් නොව බටහිරයන් හා ඉන්දියාව ඉදිරියේ දණින් නොවැටී ඔවුන්ගේ බලපෑම්වලට හිස නොනමා කොටි පරාජය කිරීමට දේශපාලන නායකත්වය ලබාදුන්නේ මහින්ද රාජපක්ෂ මහතා බව ය. එ ජා පයේ නිවට ජනාධිපතිවරුන්ට මෙන් ම බටහිර ගැති චන්ද්‍රිකා කුමාරතුංගට ද කළ හැකි වූයේ බටහිරයන්ට හා ඉන්දියාවට දණගසමින් මෙරට ජනතාව ඉදිරියේ පෙණය පිප්පීම ය. ඒ සරත් මේ සරත්වීමට පෙර විජාතික බලවේගයක් වූ එ ජා ප නිවට නායකයන්ගේ පරිභවයට උපහාසයට ලක් වී සිටියේ ය. එහෙත් ඔහු මේ සරත්වීමෙන් පසු ඔහු නිවටයන්ගේ වීරයකු බවට පත් වී ඇත. එදා සිට ම කොටින්ට විරුද්ධව කළ හමුදා මෙහෙයුම්වලට එරෙහිව සිටි ඒ හෙළා දුටු සමච්චලයට ලක්කල නිවටයන්ගේ වීරයකු තවත් නිවටයකු මිස වීරයෙක් නො වේ. අපට ඒ සරත් වීරයෙකි. දේශද්‍රෝහී ඊළාම් නඩයට මේ සරත් වීරයෙකි. අද බටහිරයන්ට ද මේ සරත් වීරයෙකි. අපට මේ සරත් ජාතිද්‍රෝහියෙකි; රාජද්‍රෝහියෙකි.

© Prof. Nalin De Silva

අද අමෙරිකාව හා අනෙක් බටහිර යටත්විජිතවාදීන් සරත් ෆොන්සේකා ඊනියා යුද්ධාඅපරාධවලින් නිදහස් කර ඇති බව පැහැදිලි ය. කැලිෆෝනියා අධිකරණය හමුවේ ඇති චෝදනාවලින් පමණක් නොව ඉන්පසුව සිද්ධවුනේ යැයි කියන චෝදනාවලින් ද ඔහු නිදහස් ය. ඒ හුදු මානව දයාවෙන් කළ නිදහස් කිරීමක් නො වේ. බටහිර යටත්විජිතවාදීන්ට මොන මානව දයාවක් ද? බටහිරයන් ඔහුට නිදහස දෙන්නේ ඔහු පාවාදීමක් කර ඇති බැවිනි. සරත් ෆොන්සේකා ඒ නිදහස ලබාගන්නේ රටත් ජාතියත් හමුදාවත් සේනාධිනායක මහින්ද රාජපක්ෂ මහතාත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාත් පාවාදීමෙනි. රටටත් ජනාධිපතිතුමන්ටත් ආරක්ෂක ලේකම්තුමන්ටත් විරුද්ධව ඇමරිකන් රජයේ සාක්ෂිකරුවකු ලෙස බටහිරයන්ගෙ හොර ගුබ්බෑයම් වූ ඊනියා ජාත්‍යන්තර යුද්ධාධිකරණයේ සාක්ෂි දීමට ඉදිරිපත් වීමෙනි. හමුදා අධිකරණයෙන් ඔහුට කිනම් දඬුවමක් දුන්නත් ඒ ප්‍රමාණවත් විය නො හැකි ය. දොන් ජුවන් ධර්මපාලගෙන් පසුව ජාතිද්‍රෝහීන් කෙතෙක් සිටිය ද මෙයට වඩා පාවාදීමක් කළ ජාතිද්‍රෝහියකු තවත් දකින්නට නැත. සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගනු ලැබීමට පැයකට දෙකකට පමණ පෙර ලෝකයේ පවත්නා ජඩම ජඩමාධ්‍යයක් වූ බීබීසියේ (සුද්දන්ගේ ඊනියා අපක්ෂපාතීත්වය ගැන ඕනෑ තරම් කරුණු දැක්විය හැකි ය) අගු පිලේ වැතිරෙන කසිකබල් මාක්ස්වාදීන් කිහිප දෙනකු සුද්දන්ට බැළ මෙහෙවරකම් කරමින් ප්‍රචාරය කරන සංදේශයට කියා සිටියේ ඊනියා යුද්ධාපරාධ කළ කිසිවකු බේරාගැනීමට තමන් ඉදිරිපත් නොවන බවත් ඔවුන් හෙළිදරවුකරන බවත් ය. ඔහු ඒ ප්‍රකාශයෙන් වීරෝදාර හමුදාවට හා රණවිරුවන්ට ද්‍රෝහි විය. ඔහු හමුදා මාණ්ඩලික නිලධාරිත්වයෙන් විශ්‍රාම ගන්නා තුරුම හමුදා සේවයේ යෙදී සිටියේ ය. ඔහුගේ තනතුර සිවිල් තනතුරක් නො වීය. ඔහු ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක් විය. එසේ සාමාජිකයකු වූයේ සිවිල් තනතුරක් දරන්නකු ලෙස නො වේ. ඔහු සූදානම් වන්නේ හමුදා රහස් බටහිර අධිකරණයට විකුණා තමන් නිදහස් වීමට ය. බ්‍රිතානිය ඇෆ්ගනිස්ථානයේ හමුදා රහස් නොරැකි හමුදා නිලධාරියකුට යුද්ධාධිකරණයේ නඩු පැවරුවේ නො බෝදා ය. ඒ ඉතිහාසයේ පළමු වතාවට සිද්ධ වූවක් නො වේ.

සරත් ෆොන්සේකා ඊනියා සුදුකොඩි ජවනිකාව රටට හෙළිකෙළේ  පසුගිය දෙසැම්බර් 13 වැනි දා පළවූ සන්ඩේ ලීඩර් පුවත්පතිනි. සුදුකොඩි කතාව ඇත්ත වුවත් නැතත් සරත් ෆොන්සේකා ඒ බවක් රටට හෙළි කිරීමෙන් ශවේන්ද්‍ර සිල්වා මහතාත් ගෝඨාභය රාජපක්ෂ මහතාත් හමුදාවත් පාවා දී ඇත. දෙසැම්බර් 27 වැනි දා දිවයින ඉරිදා සංග්‍රහයෙන් අපි මෙසේ කීවෙමු. “සරත් ෆොන්සේකාට අප නිදැල්ලේ සිටීමට අවසර දිය යුතු ද? ඔහු කළ ප්‍රකාශය සත්‍ය යැයි සිතමු. එනම් සුදු කොඩි රැගත් වාමදේවන්ලාට කාගෙ වුවත් අණකින් වෙඩි තබා ඇතැයි සිතමු. හිටපු හමුදාපති ලෙස ඔහු ඒ බව ලෝකයට අනාවරණය කළ යුතු ද? ඔහුගේ විනය අනුව සිද්ධ වූ දේ (එසේ සිද්ධවිණි නම්) රහසක් ලෙස තබාගැනීමට ඔහු බැඳී ඇත. මෙරට ජනාධිපති වී විනයගරුක සමාජයක් ඇතිකරන බවට බෙරිහන් දෙන්නේ එලෙස හමුදා විනය නොරැකි පුද්ගලයකු ද?  හමුදා රහස් නොරැකි හමුදාපතිවරයකු ලෙස ඔහු මෙරට යුද්ධාධිකරණය ඉදිරියට ගෙන ඒමට හැකි ද? අද ඔහු විශ්‍රාම ගොස් ඇති බැවින් මේ සම්බන්ධ නීතිය කුමක් දැයි නො දනිමු. කෙසේ වෙතත් ඒ ගැන සොයා බැලිය යුතු වෙයි. අනෙක් අතට එසේ සුදු කොඩි රැගෙන ඒමක් නොවී යැයි සිතමු. වාමදේවන් ඇතුළු පිරිස වෙඩි හුවමාරුවක දී මිය ගියේ යැයි සිතමු. එවිට කවුදෝ ජනමාධ්‍යවේදියකු කී පමණින් කිසිම සෙවිල්ලක් බැලිල්ලක් නැතිව පුවත්පත්වලට ප්‍රකාශ කිරීමෙන් ෆොන්සේකා කර ඇත්තේ තදබල වරදකි. ඔහු හුදු ඕපාදූප මත රැඳෙමින් හමුදාවට හා රාජ්‍යයට විරුද්ධව අසත්‍ය ප්‍රකාශ කරයි. හිටපු හමුදාපතිවරයකු ලෙස ඔහුට එවැනි අසත්‍ය ප්‍රකාශ කර බේරී යෑමට ඉඩදිය යුතු ද? ඔහු දැන් තමා කළ ප්‍රකාශය නිවැරදිව සඳහන් නොවී යැයි කියයි. ඒ කෙසේ වෙතත් විශ්‍රාමික හමුදාපතිවරයකු ලෙස ඔහු යුද්ධාධිකරණය ඉදිරියට පැමිණවිය හැකි දැයි සොයා බැලිය යුතු ය.” දැන් නීතිය පැහැදිලිය. හමුදා පනතේ 57(1) වගන්තිය ගැන අද කවුරුත් පාහේ දනිති. සරත් ෆොන්සේකා වෙනුවෙන් අද සකලවිධ විජාතික බලවේග ක්‍රියාත්මක වෙයි. ඔවුන්ට අවශ්‍ය වනුයේ ඔහු තවත් අවුංසාන් සූකී කෙනකු කිරීමට ය. සූකී බටහිර ගැත්තියක පමණක් බව මේ අවස්ථාවේ දී සඳහන් කරමු. අද මෙරට සිටින විජාතික බලවේග ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමට විරුද්ධව උද්ඝෝෂණ පවත්වන්නේ හුදෙක් බටහිර ජනමාධ්‍ය එල්ල කරගෙන ය. මෙරට වශයෙන් ගත්කල ඔවුහු අධිකරණයට අපහාසකිරීමටත් බලපෑම්කිරීමටත් පෙළඹී සිටිති. එහෙත් ඔවුන් අමතක කරන කරුණ නම් මෙරට ජනතාවගෙන් අති විශාල බහුතරයක් මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දුන්නේ ආණ්ඩුව බටහිරයන්ගේ ඇසින් බැලුකල කර ඇතැයි කියන ඊනියා යුද්ධාපරාධ අනුමතකරමින් බව ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva